# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය (2024)

(කලාප මට්ටම)

01. අපේක්ෂකයාගේ නම :- ..............................................................................................

(මුලකුරු සමඟ නිවැරදිව ලියන්න)

02. පාසලේ නම :-..............................................................................................

03. පාසල් වර්ගය :-.200 තෙක්/201-500 අතර/500 ට වැඩි

04. කොට්ඨාසය :-..............................................................................................

05. කලාපය :-..............................................................................................

6 ශ්‍රේණිය **සාහිත්‍ය දැනුම මිනුම** කාලය පැය 2 යි.

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

01. පෙළපොත ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රකාශය | ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක්ද? | කාහට කියන ලද්දක් ද? |
|---|---|---|---|---|
| 01 | අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්න ඇත්තම් | | | |
| 02 | ''කොටින්ම කට අරින්න තහනම්'' | | | |
| 03 | ''කුමක් නිසා උනුද?'' | | | |
| 04 | මේක එක කටකටත් මදිනේ? | | | |
| 05 | ''නුඹ වහන්සේ එනතෙක් බලා උනුම්හ'' | | | |

(ලකුණු 15)

02. පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

i. අනුන්ට බුහුමන් දී සලකන්නේ

..................................................................

..................................................................

ලබන්ට නම්බුව නොසිතාපන්නේ

ii. ...................................................................

තමන් තමන්ගේ වැඩෙහී යෙදෙත්වා

...................................................................

අඬත් නටත් ගස් අතරේ කුරුල්ලෝ

iii. ...................................................................

...................................................................

නෙලුම් කුමාරිට කියන්නවුන් වගේ

විලේ පියාඹත් බමරෝ රුරුං ගගා

(ලකුණු 15)

03. පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. උයද සිරි කවිපන්තිය රචනා කලේ කවුරුන්ද?

...................................................................

ii. වැද්දන්ගේ විකාශන ක්‍රමය යන කෘතිය රචනා කලේ කවුරුන්ද?

...................................................................

iii. උපදේශනාත්මක කෘතියක් නම් කරන්න.

...................................................................

iv. ඥානෝදය කතා කෘතියෙහි රචකයා කවුද?

...................................................................

v. වැදිජනයා ගැන පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියූ දේශීය විද්වතුන් දෙදෙනෙක් නම් කරන්න.

...................................................................

04. පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

i. කෙටල .......................... ii. කරක්ගහලා ..........................

iii. යාබද .......................... iv. රොක්කර ..........................

v. තඩ .......................... vi. අප්‍රතික්‍රියාවස්ථාව ..........................

vii. දක්ෂිණාංශයේ .......................... viii. මාගම ..........................

ix. විදග්ධ .......................... x. හර්ෂය ..........................

(ලකුණු 10)

05. පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න.

i. උදෙසා , සඳහා යන පද නිපාත නොවේ. ( )

ii. රෝගීන් , ශිෂ්‍යයෝ යන පද අනුකතවේ. ( )

iii. සෑම ව්‍යංජන අක්ෂරයක්ම හල් කළ හැකිය. ( )

iv. සුබ පැතුම්පතක් සකස් කිරීමේ දී ස්ථානය යෙදීම අනිවාර්ය වේ. ( )

v. පැල යනු කුඩා ගසක් යන අරුත යෙදේ. ( )

(ලකුණු 10)

06. ඔබ දන්නා ජන කවි වර්ග 02 කට උදාහරණයක් ලියන්න. කවි වර්ග නම් කරන්න.

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

..................................................................

(ලකුණු 10)

07. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

I. උදක රාක්ෂසයා ද ඒ වඳුරන් දියට නො බස්නාවුන් දැක නිල්වූ බඩ හා ධවල වූ මුඛ ඇතිව රත්වූ අතුල් තල, පතුල් තල ඇතිව භයංකර වේශයෙන් දිය දෙබෑ කොට නික්ම ....

..................................................................................................................................

..................................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

II. අතින් අත බැඳ පෙළ
නොයන් මං මාවත්වල
තැනින් තැන කඩවල
නොයන් කරුණක් නැතිව කිසිකල

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

III. වැඩක නො යෙදූ සිත
නරක අතට ම පෙරළෙන
කිමෙක වන යහපත
වැඩක එබැවින් යොදනු තම සිත

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 3x5 = 15 )

08. පහත සඳහන් කවිය ඇසුරින් පිළිතුරු ලියන්න.

* නිකම් ඉඳීමෙන් පල නෑ ගෙ මුල්ලේ
තමන් තමන්ගේ වැඩෙහී යෙදෙත්වා
කියන්නවුන් මෙන් ගනතිල් කැළෑවේ
අඬත් නටත් ගස් අතරේ කුරුල්ලෝ.

i. මෙහි ඇතුලත් ආශිර්වාද ක්‍රියා පදයක් ලියන්න. ....................................................

ii. නිපාත පදයක් ලියා දක්වන්න. ...........................................................................................

iii. බහුවචන ක්‍රියාපද 02 ක් ලියන්න. .....................................................................................

iv. "වනය" යන පදයට සමාන පදයක් ලියන්න ..................................................................

v. බහු වචන නාම පද 02ක් ලියන්න. .....................................................................................

(ලකුණු 2x5 = 10)

09. පහත වාක්‍යවල උපමාව උපමේය වෙන්කර ලියන්න.

i. පෝයදා අහස රන්තැටියක් වැනිය.

ii. උදෑසන පාසල් යන ළමුන් සුදු කොක්කු රැනක් සේ දිස්විය.

iii. අගේ දෙනුවන් මැණිකක් බඳු විය.

iv. නිල්තණකොළ පිට්ටනියක් වගෙයි අහස.

v. අබසාවිතර සිහින් ගෙඩි ඇතිව.

| | <u>උපමා</u> | <u>උපමේය</u> |
|---|---|---|
| i. | .................................................... | .................................................... |
| ii. | .................................................... | .................................................... |
| iii. | .................................................... | .................................................... |
| iv. | .................................................... | .................................................... |
| v. | .................................................... | .................................................... |

(ලකුණු 1x5 = 5 )